# DAC
# ඇගයීමේ නිර්ණායක
## සඵලතාව

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුනි, ඔබගේ ඡන්දදායකයින්ට වඩාත් සමීප හා කාර්යක්ෂම නියෝජිතයන් වීමට ඔබ කැමැත්තක් දක්වන්නේද?

ඔබේ ඡන්දදායකයන් නියෝජනය කරමින් පාර්ලිමේන්තු විවාදවලදී නිසි ප්‍රශ්න මතු කරමින් රටේ සංවර්ධනය උපරිම කිරීමට හා එහි ප්‍රතිඵල ඔවුන්ට ලබාදීමට ඔබ උනන්දුවක් දක්වන්නේද?

එසේ නම් ඇගයීම පිළිබඳ **OECD DAC** නිර්ණායක ඔබට ප්‍රයෝජනවත් වියහැක. ඒ සඳහා මෙම කෙටි පත්‍රිකා මාලාව කියවන්න.

**ඇගයීම් පිළිබඳ ආසියා පැසිෆික් කලාපයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංසදය**

## හැඳින්වීම

ප්‍රජාතන්ත්‍රවාදයේ මූලිකහරය වන්නේ පාර්ලිමේන්තුව තුලින් වගවීම, විනිවිදභාවය හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට කටයුතු කිරීමයි. නීති සම්පාදනයේ ප්‍රමුඛයින් වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් රටේ සංවර්ධනයේ ප්‍රධාන කොටස්කරුවන්ය. පාර්ලිමේන්තු විවාදවලදී සංවර්ධන වැඩසටහන් පිළිබඳව හරවත් ප්‍රශ්න ඇසීම මගින් ඇගයීම් වලින් ලබාගන්නා තොරතුරු භාවිතා කිරීමෙන්, තිරසාර සංවර්ධනය සඳහා ජාතික ක්‍රියාවලියෙන් සම්පත් වෙන්කිරීමේදී පාර්ළිමේන්තු මන්ත්‍රීවරුන්ට මෙම ක්‍රියාවලියට දායකවිය හැකිය.

සංවර්ධනය සඳහා වන මැදිහත්වීම් පිළිබඳ මනා අවබෝධය සමග ඒකාබද්ධ වූ OECD/DAC ඇගයීම් නිර්ණායක පුරවැසියන් සඳහා උපරිම ප්‍රතිලාභ සහතික කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට පාර්ලිමේන්තු විවාද සහ ආයෝජන කමිටු රැස්වීම්වලදී හරවත් ප්‍රශ්න ඇසීමට සහාය විය හැකිය.

මෙම පත්‍රිකා මාලාව තුලින් OECD/DAC නිර්ණායක හය පිළිබඳව විස්තර කරනු ලබයි.

## සඵලතාව

OECD/DAC මගින් සඵලතාව නිර්වචනය කරන්නේ, කණ්ඩායම් හරහා ඕනෑම ආන්තරික ප්‍රතිඵල ඇතුළුව, එහි අරමුණු සහ එහි ප්‍රතිඵල සාක්ෂාත් කරගත් හෝ සාක්ෂාත් කරගැනීමට අපේක්ෂා කරන සංවර්ධන වැඩසටහන් වල ප්‍රමාණයයි.

## මූලික අර්ථ දැක්වීම්

අරමුණු හෝ ප්‍රතිඵලවල සාපේක්ෂ වැදගත්කම සැලකිල්ලට ගැනීම සඵලතාව විශ්ලේෂණය කිරීමේදී වැදගත් වේ.

සඵලතාව යන යෙදුම කාර්යක්ෂමව සහ ඒකාබද්ධව තිරසාර බලපෑම් සාක්ෂාත් කරගෙන ඇති හෝ සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරන ප්‍රමාණයේ සමස්ත මිනුමක් ලෙසද භාවිත වේ.

### උචිතබව
සංවර්ධන වැඩසටහන
නිවැරදි දේ සිදු කරන්නේද?

### සඵලතාව
සංවර්ධන වැඩසටහන
එහි අරමුණු ළඟා කරගන්නේද?

### බලපෑම
සංවර්ධන වැඩසටහන
කිනම් වෙනසක් ඇති කරන්නේද?

**ඇගයීමේ නිර්ණායක**

### ඒකාබද්ධභාවය
සංවර්ධන වැඩසටහන
කොතරම් දුරට යෝග්‍ය වන්නේද?

### කාර්යක්ෂමතාව
සම්පත් කොතරම්
දුරට භාවිත වන්නේද?

### තිරසාරභාවය
ප්‍රතිලාභ දීර්ඝ
කාලීනව පවතින්නේද?

## පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සඵලතාව පිළිබඳ නිර්ණායක භාවිත කළ හැකි ආකාරය

රාජ්‍ය අරමුදල් යොදවා ක්‍රියාත්මක කරන ප්‍රධාන සංවර්ධන වැඩසටහන් පිළිබඳ අධීක්ෂණය කිරීමට පාර්ලිමේන්තුවට වගකීමක් ඇත. එවැනි ව්‍යාපෘතිවල සඵලතාව පිළිබඳව ප්‍රශ්න නැගීමෙන් ජනතාව සඳහා අපේක්ෂිත ප්‍රතිලාභ සත්‍ය වශයෙන්ම ඉටු වන්නේද යන්න පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට තීරණය කළ හැකිය.

වැඩසටහනක සඵලතාව සහ එය තීරණය කරන සාධක අවබෝධ කර ගැනීම, එය නැවත සැලසුම් කළ යුතුද නැතහොත් ප්‍රතිනිර්මාණය කළ යුතුද යනුවෙන් පසුකාලීන අදියරවලදී වැඩිදියුණු කළ හැකි ආකාරය පිළිබඳ තීරණ දැනුම් දීමට උපකාරී වේ.

සඵලතාව පිළිබඳ ප්‍රශ්න නැගීමෙන් රාජ්‍ය අරමුදල් අපේක්ෂිත මට්ටමට ළඟා වී තිබේද යන්න හෙළිදරව් කරගත හැකිය. නිදසුනක් වශයෙන්, දිළිඳුකම පිටුදැකීමේ වැඩසටහනක් සමාලෝචනය කිරීමේදී, ආදායමේ වැඩි වීමක් දක්නට ලැබෙන පවුල් සංඛ්‍යාව, ඔවුන්ගේ ආදායම කොපමණ වැඩි වී තිබේද, පවුල් කොපමණ සංඛ්‍යාවක් දරිද්‍රතාවෙන් මුදාගෙන තිබේද සහ එම වෙනස්කම් සිදුවූයේ කුමන කාල සීමාව තුළද යන්න පිළිබඳ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට කරුණු විමසිය හැකිය. වෙනත් උපාය මාර්ගයක් භාවිත කළ හැකි විකල්ප සංවර්ධන වැඩසටහන් සමග වැඩසටහනේ සඵලතාව සංසන්දනය කිරීමට එවැනි තොරතුරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ඉඩ සලසයි.

ඇගයීම් වාර්තා බොහෝවිට ඇගයීමට ලක්කෙරෙන වැඩසටහනේ සඵලතාව තීව්‍රකරන අතර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ඇති විය හැකි ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට උපකාරී වේ. මෙම වාර්තා ඉල්ලා සිටීමෙන් සහ සඵලතාව පිළිබඳ වැඩිදුර ඉගෙනීමෙන්, පාර්ලිමේන්තු සභිකයන්ට අදාළ වැඩසටහන හෝ ප්‍රතිපත්තිය පිළිබඳ  නිසි ප්‍රශ්න සැකසීමටද උපකාර වේ.

## සඵලතාව සහතික කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ඇසිය හැකි ප්‍රශ්න

සංවර්ධන වැඩසටහනක, ව්‍යාපෘතියක හෝ ප්‍රතිපත්තියක සඵලතාව පිළිබඳව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් ඇසිය හැකි ප්‍රශ්න සඳහා නිදසුන් පහත දැක්වේ. කෙසේ වෙතත්, ප්‍රශ්න ඇසීමේදී නිර්මාණශීලී වීම සහ රටේ අන්තර්ගතය සැලකිල්ලට ගැනීම, සංවර්ධන වැඩසටහනක හෝ ප්‍රතිපත්තියේ ස්වභාවය සහ විවාදයේ සහ ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලියේ අවශ්‍යතා සැලකිල්ලට ගැනීම වැදගත් වේ.

**අ:** සාපේක්ෂ වැදගත්කම සැලකිල්ලට ගනිමින්, සැලසුම් කර ඇති කෙටි හා මධ්‍ය කාලීන ප්‍රතිඵල කොපමණ දුරට සංවර්ධන වැඩසටහන් මගින් සාක්ෂාත් කර ගෙන ඇතිද හෝ සාක්ෂාත් කරගැනීමට ඉඩ තිබේද?

**ආ:** කණ්ඩායම් හරහා අපක්ෂපාතී ලෙස ප්‍රතිඵල ලබා ගත්තේද?

**ඇ:** සමස්ත සහ කණ්ඩායම් හරහා ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීමට හෝ සාක්ෂාත් කර නොගැනීමට බලපෑ ප්‍රධාන සාධක මොනවාද?

**ඈ:** බලපෑම් කොපමණ දුරට සංවර්ධන වැඩසටහන්වලට සම්බන්ධ වී තිබේද?

**ඉ:** සංවර්ධන වැඩසටහන්වල සඵලතාවට උපකාර වූ හෝ උපකාර නොවූ සාධක මොනවාද?

---

*Source: De Silva,S.(2021).Theory of Change For Development Success: Workbook. Colombo, Sri Lanka: Sri Lanka Evaluation Association*

## සඵලතාව පිළිබඳ තවදුරටත් අධ්‍යයනය කිරීමට අවශ්‍ය මූලාශ්‍ර


OECD evaluation criteria, retrieved from
*https://tinyurl.com/2p9835a6*

OECD (2022). Understanding the six criteria: Definitions, elements for analysis and key challenges. retrieved from
*https://tinyurl.com/bddeffx8*



## ප්‍රකාශනය

ASIA PACIFIC PARLIAMENTARIANS FORUM FOR EVALUATION

APEA Asia-Pacific Evaluation Association

Global Parliamentarians Forum for Evaluation

විමසීම්: apea.coordinator@gmail.com

## සිංහල පරිවර්තනය

SLEvA
Sri Lanka Evaluation Association

විමසීම්: sleva.sec@gmail.com